චක්‍රලේඛ අංක: 1993/ 08

මගේ අංකය: 2/ක්‍රීවිබා/4/5/IV
ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.

1993 අප්‍රේල් මස 22 දින.

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කො. අ. කා. භාර නි. අ. අධ්‍යක්ෂවරුන්,
සියලුම සෞන්දර්ය නි. අ. අ. වරුන් හා ස. අ. අ. වරුන්,
සියලුම විදුහල්පති/පතිනියන් වෙත.

## අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේත් ටවර් හෝල් රඟහල පදනමේත් මෙහෙයවීමෙන් පවත්වනු ලබන සමස්ත ලංකා පාසල් නූර්ති (නාට්‍ය) තරගය - 1993/94

සිවි වන වරටත් ඉහත සඳහන් තරගය පැවැත්වීම සඳහා අවශ්‍ය විධි විධාන දැනට යොදා ගෙන ලැබේ.

1.0 සහභාගිත්වය:

1.1 දිවයිනේ ඇති රජයේ පාසල්, කලින් උපකෘත පාසල් වශයෙන් පැවති පාසල් සහ වෙනත් අනුමත පාසල්වලට මෙම තරගයට සහභාගි විය හැකිය.

1.2 තරගයට සහභාගි වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් තම පාසලේ ඉගෙනුම ලබන බවට විදුහල්පති/පතිනිය විසින් සහතික කළ යුතුය.

1.3 තරගයට ඉදිරිපත් කරනු ලබන නූර්තිය සඳහා අවශ්‍ය සංගීතය හෝ ගීත හෝ පටිගත කර හෝ තැටි ගත කර වාදනය කිරීමට ඉඩ දෙනු නොලැබේ.

2.0 මෙම තරගය සඳහා ඉදිරිපත් කළ හැකි නූර්ති:

1. සමුද්‍රදේවී
2. විදුර
3. රාමායනය
4. පද්මාවතී
5. වෙස්සන්තර
6. උම්මග්ග
7. සිංහලේ වීරයා

2.1 යම් පාසලක් 1990/ 91 වර්ෂයේ පැවති නූර්ති තරග සඳහා ඉදිරිපත් කරන ලද නූර්ති (නාට්‍ය) යක් සඳහා ත්‍යාග ලබා ඇත්නම් මෙම වර්ෂයේ තරග සඳහා එම නාට්‍ය ඉදිරිපත් නොකළ යුතුය.

3.0 තරඟ අවස්ථා:

මෙම තරඟය මූලික වටය, දෙවන වටය හා අවසාන වටය යනුවෙන් අවස්ථා තුනකින් පැවැත්වේ.

3.1 මූලික වටය:

අධ්‍යාපන කලාප මට්ටමින් මෙම තරඟ වටය පැවැත්වේ. මෙහිදී නළු නිළියන් සඳහා නියමිත ඇඳුම් පැළඳුම් ආදියෙන් යුක්තව නාට්‍ය ඉදිරිපත් කිරීම අපේක්ෂා නොකරන අතර, ඒ සඳහා ලකුණු දීම ද නො කෙරේ. සුදුසු විනිශ්චය මණ්ඩලයක් යොදවා තරඟය විනිශ්චය කරන හා එහි සංවිධානය කලාපය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ. සුදුසු ශිල්පීය මට්ටමට පැමිණ නැති නාට්‍ය දෙවන වටය සඳහා ඉදිරිපත් නො කෙරේ. දෙවන වටය සඳහා නාට්‍ය එකක් කලාපයෙන් තෝරා ඒ විස්තර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්විය යුතුය. එහි පිටපතක් මෙම අමාත්‍යාංශයේ ක්‍රීඩා හා විෂය බාහිර ශාඛාවේ නි. අ. අ. වෙත ද එවිය යුතුය.

3.2 මෙම තරඟය සඳහා ඉදිරිපත් වන සියළුම පාසල් පහත සඳහන් ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍ර පිටපත් තුනකින් සකස් කොට එක් පිටපතක් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ශාඛාවේ නි. අ. අ. වෙත ද ඊළඟ පිටපත තම පළාතේ ප. අ. අ. වෙත ද යැවිය යුතු අතර, තෙවන පිටපත විද්‍යාලයේ ලිපි ගොනුවේ තබා ගත යුතුය. මෙම ඉල්ලුම් පත් එවිය යුතු අවසාන දිනය 1993 ජුනි 15 දින වේ. මූලික වටයේ තරඟ 1993 ඔක්තෝබර් 30 දිනට පෙර අවසන් කළ යුතුය.

4.0 දෙවන වටය තරඟ:

මූලික වටයේ ප්‍රතිඵල ලැබීමෙන් පසු පළාත් මට්ටමේ තරඟය සංවිධානය කිරීමේ වගකීම ප. අ. අ. වරුන් වෙත පැවරේ. මෙම තරඟ 1994 ජනවාරි 31 දාට පෙර පවත්වා අවසන් කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය විනිශ්චය මණ්ඩල අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව ටවර් රඟහල පදනම මගින් සපයනු ලැබේ.

5.0 අවසාන වටය:

දෙවන වටයේ තරඟයෙන් සුදුසුකම් ලබන පාසල් අතර පවත්වනු ලබන අවසාන මහා තරඟය කොළඹදී පැවැත්වේ. එක් එක් වර්ගයේ තූර්තියෙන් ප්‍රථම ස්ථානය දිනා ඇති පාසල් අතර, මෙම තරඟය පැවැත්වෙන අතර, ඉන් ජයග්‍රහණය කරනු ලබන තූර්ති හා එහි නළු නිළියන් සඳහා පහත සඳහන් පරිදි ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමීමට සංවිධායකයෝ බලාපොරොත්තු වෙති.

5.1 සහතික හා ත්‍යාග:

ප්‍රථම ස්ථානය - මුදලින් රුපියල් හතලිස් දාහයි,

දෙවන ස්ථානය - මුදලින් රුපියල් තිස්පන් දාහයි,

තෙවන ස්ථානය - මුදලින් රුපියල් තිස් දාහයි.

4,5,6,7, ස්ථාන සඳහා: එක් නාට්‍යයකට රුපියල් විසිපන් දහස බැගින්

අවසාන තරඟය සඳහා සහභාගි වන සියළුම විද්‍යාලවලට, නාට්‍ය පුහුණු කළ ශිල්පීන්ට සහ නළු නිළියන් සියළු දෙනාට කුසලතා සහතිකය බැගින් පිරිනැමේ.

මෙයට අමතරව නාට්‍ය හතේම හොඳම රඟපෑම් ඉදිරිපත් කළ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් 14 දෙනෙකුට මසකට රු. 250/- බැගන් වසර 4 ක කාලයක් සඳහා ශිෂ්‍යත්ව ආධාර මුදලක් ගෙවනු ලැබේ.

6.0 තරඟයට සහභාගි වීම සඳහා ඉල්ලුම් පත් ලැබීමෙන් පසු ඒ ඒ නාට්‍යයට අදාළ නාට්‍ය පිටපත ද එම නාට්‍යයේ ගීත කැසට් පටිය ද විදුහල්වලට ලැබෙන්නට සලස්වන අතර, පුහුණු කටයුතු විධිමත් කර ගැනීම සඳහා නාට්‍ය පුහුණු කරන ගුරුවරුන් සඳහා පුහුණු සැසියක් පැවැත්වීමට ද බලාපොරොත්තු වේ.

6.1 පළමු වන හා දෙවැනි වටය තරග නියමිත කාලය තුළ පවත්වා අවසන් කිරීමටත් හැකි තරම් වැඩි පාසල් සංඛ්‍යාවක් මෙම තරඟයට සහභාගි කරවීමටත් කො. අ.කා. භාර නි. අ. අ. වරුන්/කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ප. අ. අධ්‍යක්ෂවරුන් අවශ්‍ය පියවර ගන්න.

සුනිල් ජයවීර,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්
(ක්‍රීඩා)

අ.ක./ එම්. ඩී. ඩී. පිරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශයේ ලේකම්,

# ආදර්ශ ඉල්ලුම් පත්‍රය

## 1993/94 නූර්ති (නාට්‍ය) තරඟය සඳහා ඉල්ලුම් පත්‍රය

01. විද්‍යාලයේ නම :-

02. විද්‍යාලයේ ලිපිනය :-

03. විද්‍යාලයේ දුරකථන අංකය / ළඟම ඇති දුරකථන අංකය :-

04. විද්‍යාලය අයත් කො.අ. කාර්යාලයේ ලිපිනය :-

05. කො. අ. කා. භාර නි. අ. අ. ගේ නම :-

06. පළාත :-

07. ඉදිරිපත් කරන නූර්තිය :-

විදුහල්පති/පතිනියගේ අත්සන
නිල මුද්‍රාව

දිනය :-

සැ. යු. 1993. 06. 15 දිනට පෙර ඉල්ලුම්පත් එවිය යුතුයි.

ඉල්ලුම් පත්‍ර :-

| | | |
|---|---|---|
| 01 පළමු වන පිටපත :- | තම පළාතේ ප. අ. අ වෙත ද | |
| 02 දෙවන පිටපත :- | ඒ. කේ. ජිනදාස<br>නි. අ. අ.(ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ශාඛාව,<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,<br>'ඉසුරුපාය', බත්තරමුල්ල යන ලිපිනයට ද එවිය යුතු අතර, | |
| 03 තෙවන පිටපත :- | විද්‍යාලයීය ලිපි ගොනුවට ඇතුළත් කළ යුතුය. | |